ඇමුණුම 01

ලකුණු ලබාදීමේ පටිපාටිය

| මාතෘකාව | උපරිම ලකුණු |
|---|---|
| 01. ප්‍රධාන/කේන්ද්‍රීය නිපුණතාවයන් | 500 |
| 02. පළපුරුද්ද | 400 |
| 03. භාෂා ප්‍රවීණතාවය | 100 |
| මුළු ලකුණු | 1000 |

01. නිලධාරියාගෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රධාන/ කේන්ද්‍රීය නිපුණතාවයන් - 500

ප්‍රධාන /කේන්ද්‍රීය නිපුණතාවයන් ඇගයීම - ඵලදායී තීරණ ගැනීම

ආදර්ශ සම්මුඛ පරීක්ෂණ ප්‍රශ්නය - සංකීර්ණ ගැටළුවක් සඳහා ඔබට විසඳුමක් ලබා දීමට සිදුවූ අවස්ථාවක් විස්තර කරන්න.

<u>පිළිතුරු ලබා දීමේ ක්‍රමවේදය</u> - සන්ධර්භය (Context) ක්‍රියාකිරීම(Action) සහ ප්‍රතිඵලය (Result), එනම් : CAR ක්‍රමවේදය හෝ අවස්ථාව (Situation), කාර්යය (Task), ක්‍රියාකිරීම(Action) සහ ප්‍රතිඵලය (Result) එනම් : STAR ක්‍රමවේදය භාවිතා කරමින් මෙවැනි ගැටළුවලට පිළිතුරු ගොඩනැංවීමට අයදුම්කරුවන්ට මඟපෙන්වනු ලැබේ.

<u>*ධනාත්මක සාක්ෂි*</u> -පවතින සියලුම අවස්ථා, අවදානම සහ ඇතිවිය හැකි බලපෑම් සැලකිල්ලට ගෙන ඇත. අවදානම් සහ සෘණාත්මක බලපෑම් අවම කිරීම සහ කළමණාකරණය කිරීම සඳහා සැලැස්මක් නිර්දේශ කොට ඇත.

<u>*සෘණාත්මක සාක්ෂි*</u> - අවදානම, අවස්ථා සහ විකල්ප පූර්ණ අවධානයට ලක් නොකොට නිර්දේශ ඉදිරිපත් කොට ඇත.

<u>පිළිතුර පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ විශ්ලේෂණය</u> - අයදුම්කරුගේ කේන්ද්‍රීය/ප්‍රධාන නිපුණතාවය පහත සඳහන් මාර්ගෝපදේශ මත පදනම්ව ඇගයීමට ලක්කරනු ඇත. ප්‍රශ්න තුනකට නොඅඩු සහ හයකට නොවැඩි ගණනකින් ප්‍රශ්න ඇසිය යුතුවේ.

වගුව A

| | |
|---|---|
| ඉහළ මට්ටමේ නිපුණතාවයක් පිළිබඳ ධනාත්මක ලක්ෂණ පෙන්නුම් කරන අතර සැලකිය යුතු මට්ටමක සෘණාත්මක ලක්ෂණ නොමැත. | 5 |
| නිපුණතාවය පිළිබඳ ධනාත්මක ලක්ෂණ පෙන්නුම් කරන අතර තරමක සෘණාත්මක ලක්ෂණ පෙන්නුම් කරයි. | 4 |
| නිපුණතාවය පිළිබඳ ධනාත්මක ලක්ෂණ හා සෘණාත්මක ලක්ෂණ සම මට්ටමක පවතී. | 3 |
| නිපුණතාවය පිළිබඳ තරමක ධනාත්මක ලක්ෂණ පවතින අතර සැලකිය යුතු මට්ටමක සෘණාත්මක ලක්ෂණ පවතී. | 2 |
| නිපුණතාවය පිළිබඳ ධනාත්මක ලක්ෂණ ඉතා අඩු හෝ නොමැති අතර සෘණාත්මක ලක්ෂණ වැඩි මට්ටමක පවතී. | 1 |

02. පළපුරුද්ද ඇගයීමට ලක් කිරීම -400

- විවිධ තනතුරු දැරීමෙන් ලබා ඇති පළපුරුද්ද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. (ලකුණු 175)
- අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු/කොමිෂන් සභා
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල /ප්‍රාදේශීය ලේකම් කාර්යාල /රේඛීය අමාත්‍යාංශයේ ප්‍රාදේශීය කාර්යාල/ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය කාර්යාල
- පළාත් සභා

වසරකට ලකුණු 15 බැගින් ලබා දෙනු ලබන අතර, ඉහත සඳහන් කළ ඒක් කාණ්ඩයක් සඳහා ලබා දෙන උපරිම ලකුණු සංඛ්‍යාව 120 කි.

- පළපුරුද්ද සම්බන්ධයෙන් අසනු ලබන ප්‍රශ්නාවලියට ලබාදෙන පිළිතුරු මත පදනම්ව එක් එක් තනතුරේ ලබාගෙන ඇති ප්‍රවීණතාවය ඇගයීමට ලක් කොට ඇත. - ලකුණු 225 කි.
  (තනතුරක සේවය කළ වසර ගණනට අමතරව)
- නිපුණතාවය පිළිබඳ ප්‍රශ්නවලට ලබා දෙන පිළිතුරු මතම පදනම්ව එක් එක් තනතුර දැරීමෙන් ලබාගත් ප්‍රවීණතාවය ඇගයීමට ලක් කළ හැකිය. එම කොටසින් ආවරණය නොවන කිසියම් කාර්යභාරයක් වේ නම් එය, පළපුරුද්ද සම්බන්ධ ප්‍රශ්න ඇසුරින් ඇගයීමට ලක්කරනු ඇත.

උදා - ඔබ, ------- වශයෙන් සේවයේ යෙදී සිටියදී ඔබ ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණයන් විස්තර කරන්න.

පළපුරුද්ද - යෝජිත ලකුණු ලබා දීමේ ක්‍රමය

| | |
|---|---|
| විවිධ තනතුරුවල සේවය කර ඇත. ඒ සෑම තනතුරකම සුවිශේෂී ප්‍රවීණතාවයන් ලබා ඇති බවට සැහෙන සාක්ෂි ඇත. | 225 |
| විවිධ තනතුරුවල සේවය කොට ඇත. එම තනතුරු අතරින් ඇතැම් තනතුරුවල සුවිශේෂී ප්‍රවීණතාවයන් අත්කරගෙන ඇති බවට සාක්ෂි ඇත. | 150 |
| විවිධ තනතුරුවල සේවය කොට ඇති නමුත් ඒ කිසිදු තනතුරකින් හෝ සුවිශේෂී ප්‍රවීණතාවයක් අත්කරගෙන ඇති බවට සාක්ෂි නොමැත. | 75 |

03. භාෂා ප්‍රවීණතාවය -100

- නිපුණතාවයන් ඇගයීමට ලක් කිරීමේදී, අදාළ භාෂාවෙන් ප්‍රශ්න ඇසීම මගින් අයදුම්කරුවන්ගේ අනෙක් රාජ්‍ය භාෂා/ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරනු ඇත.
- අනෙක් රාජ්‍ය භාෂාව - ලකුණු 50
- ඉංග්‍රීසි -ලකුණු 50

50

ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය

| C මට්ටම - ලකුණු 10 | B මට්ටම - ලකුණු 25 | A මට්ටම - ලකුණු 50 |
|---|---|---|
| විරාමයන් හා වැරදි ආරම්භයන් ඉතා පැහැදිලිව දක්නට ලැබුණ ද කෙටි උත්සාහයන් තුළින් ඔවුන්වම අවබෝධ කරගැනීම | නිශ්චිත මාතෘකාවක් පිළිබඳ සරල විස්තරයක් ලබාදීම | සංකීර්ණ මාතෘකාවන් පිළිබඳව පැහැදිලි සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබාදීම |
| චර්යානුගත ක්‍රියාකාරකම්වල (Routine Activities) දෛනික අංග පිළිබඳව කථා කරයි. | ප්‍රධාන කරුණු පුළුල් ලෙස විස්තර කරයි | සාකච්ඡාවක් සාරාංශගත කරයි. |
| සරල ප්‍රශ්න හා පිළිතුරු හුවමාරු කරගැනීම සිදුකළ හැකිය. | ගැටළු සහගත අවස්ථා ඇති වූ විට විකල්ප සංසන්දනය කරමින් සාකච්ඡා කරයි. | මතය ප්‍රකාශ කොට පවත්වාගෙන යයි. |
| හුරුපුරුදු අවස්ථා හා මාතෘකා සම්බන්ධයෙන් සාමාන්‍ය දෛනික කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් මූලික වචන මාලාවක් හා ව්‍යාකරණ දැනුමක් ඇත. | දිගු වේලාවක් කථා කිරීමේ දී ව්‍යාකරණ හා වචන තෝරා ගැනීමට විරාමයන් ගෙන ඒවා සකස් කරන අවස්ථා පැවතිය ද, නිරායාසයෙන් කථාකරයි. | සංකීර්ණ හා උපකල්පිත ප්‍රශ්නවලට ප්‍රතිචාර දක්වයි. |
| පණිවිඩයේ පැහැදිලිභාවයට බාධාවෙන පරිදි වෙනත් භාෂාවක ආකෘතිය සහ වචන භාවිතා කරයි. | සුවිශේෂිත, සාමාන්‍ය නොවන තත්ත්වයන් හා මාතෘකා හැසිරවීමට ප්‍රමාණවත් වචන මාලාවක් සහ සරල ව්‍යාකරණ රටාවක් පවතින අතර සිද්ධිවාචක විස්තරයක් (Factual Description) ඉදිරිපත් කිරීමේ දී සරල වාක්‍ය ඛණ්ඩ සමූහයක් අනුපිළිවෙළින් සම්බන්ධ කරමින් ඉදිරිපත් කළ හැකිය. | තරමක ස්වභාවික හා ඒකාකාරී ස්වරූපයෙන් කථාකළ හැකිය. විටින් විට නැවතීම් පෙන්නුම් කළ ද ඒ අදහස් ගොනු කර ගැනීම සඳහා වේ. |
| අසන්නා සමීප අවධානය යොමුකළ යුතු ආකාරයේ උච්චාරණ විලාසයක් ඇති නමුත් අසන්නාට අපැහැදිලි වන ආකාරයට වචන අතර දිගු ඇදීම් නොමැත. | ඇතැම් අවස්ථාවල වැරදි සන්නිවේදනයක් සිදුවිය හැකි නමුත් වචන අතර සිදුකරන ඇදීම බොහෝදුරට පැහැදිලි ය. | සංකීර්ණ හා වියුක්ත (Complex & Abstract) මාතෘකා පිළිබඳ කථා කිරීමේ දී පුළුල් පරාසයක විහිදුණු වාග් මාලාවන් හා ව්‍යාකරණ ව්‍යුහ භාවිතා කරන අතර සාපේක්ෂව ඉහළ මට්ටමේ පාලනයක් ඇත. |
| | උච්චාරණ රටාවේ වෙනත් භාෂාවක ආභාෂයක් පෙන්නුම් කළ ද සාමාන්‍යයෙන් තේරුම්ගත හැකි මට්ටමේ පැහැදිලි උච්චාරණයක් ඇත.<br><br>ඇතැම්විට නැවත ප්‍රකාශ කරන මෙන් හෝ පැහැදිලි කරදෙන මෙන් ඉල්ලා සිටීමට අසන්නාට සිදුවනු ඇත. | වැරදි සිදු කරන නමුත් ඒවායින් වැරදි වැටහීමන් ඇති නොකරන තරම් වේ.<br><br>පැහැදිලි උච්චාරණයක් ඇති නමුත් උච්චාරණයේ වෙනත් භාෂාවක උච්චාරණ රටාවක් පෙන්නුම් කරයි<br><br>විටින්විට වැරදි උච්චාරණ පෙන්නුම් කරන නමුත් ඒවා සන්නිවේදනයට බාධාවන්නේ කලාතුරකිනි. |